සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 6 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## History – I

## ඉතිහාසය – I

Name :- ................................................... Grade : -............... Index number:-...................

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01-05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ඉතිහාසය ඉගැන්වීමෙන් අපට ලැබෙන ප්‍රධානතම ප්‍රයෝජනය පහත සඳහන් පිළිතුරු අතරින් තොරන්න.

(i) රජවරුන් පිළිබඳව දැන ගැනීමට ලැබීමයි

(ii) අතීතය පිළිබඳව දැන ගැනීමට ලැබීමයි

(iii) අනාගත පුරෝකථන ඉදිරිපත් කිරීමට හැකි වීමයි

(iv) අතීත අත්දැකීම් තුළින් වර්තමානය හා අනාගතය සකසා ගැනීමට හැකිවීමයි

02. පෘථිවිය නිර්මාණය වීම පිළිබඳව පොදු මතයක් ඇත. එය නම්,

(i) දෙවියන් විසින් මවන ලද්දක් බවයි

(ii) ගිනි කන්දක් සිසිල්වීමෙන් එය නිර්මාණය වී ඇති බවයි

(iii) දූවිලි වළාවක් හෙවත් නිහාරිකාවකින් එය නිර්මාණය වී ඇති බවයි

(iv) ජලය ඝන බවට පත්වීමෙන් එය නිර්මාණය වූ බවයි.

03. ගෙවිතැනට හුරුවීම, සත්ත්ව පාලනය ඇරඹීම සහ ගම්මානවල ජීවත්වීම ආදි කටයුතු ආරම්භ වූ යුගය සඳහන් පිළිතුර තෝරන්න.

(i) පුරාශිලා යුගය (ii) මාධ්‍ය ශිලා යුගය

(iii) නව ශිලා යුගය (iv) නූතන යුගය

04. ස්වාභාව ධර්මය දෙවියන් ලෙස සලකා වැඳුම් පිදුම් කළ වැසියන් විසූ ශිෂ්ටාචාරය නම්,

(i) ඊජිප්තු ශිෂ්ටාචාරය (ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

(iii) චීන ශිෂ්ටාචාරය (iv) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය

05. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



(i) ඉන්දු නිම්න ජනතාව සී සෑම සඳහා සහභාගි වූ අවස්ථාවකි

(ii) මෙසපොතේමියානු ජනතාව සත්ත්ව පාලනය සඳහා සහභාගි වූ අවස්ථාවකි

(iii) ඉන්දු නිම්න ජනතාව සත්ත්ව පාලනය සඳහා සහභාගි වූ අවස්ථාවකි

(iv) මෙසපොතේමියානු ජනතාව සී සෑම සඳහා සහභාගි වූ අවස්ථාවකි

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

➢ ප්‍රශ්න අංක 06-10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන තුළ යොදන්න.

06. ක්‍රි. ව. 2019 වෙසක් පොහොය දින වන විට බුදුන්වහන්සේ පිරිනිවන් පා වර්ෂ 2560 ක් වේ. (..........)

07. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා "ඔසට්‍රලොපිතිකස්" යන නමින් හැඳින්විය. (..........)

08. මළ සිරුරු කල් තබා ගැනීමේ මමීකරණ ක්‍රමය ලෝකයට හඳුන්වා දෙනු ලැබූවේ නයිල් නම්න ශිෂ්ටාචාරයේ වැසියන් ය. (..........)

09. දූපතක් ලෙස හැඳින්වෙන අපේ ශ්‍රී ලංකාවට මූලින් ම මිනිසුන් පැමිණියේ අවුරුදු එක්ලක්ෂ විසිපන්දාහකට පමණ ඉහතදීය. (..........)

10. විජය නමින් හැඳින්වූ කුමාරයකු ඔහුගේ පිරිවර හත්සියයක් සමග ක්‍රිස්තු පූර්ව 644 දී පමණ ඉන්දියාවේ සිට මෙරටට පැමිණ පදිංචි වූ බව ඉතිහාසයේ සඳහන් වේ. (..........)

➢ ප්‍රශ්න අංක 11-15 දක්වා ප්‍රශ්න සඳහා A තීරුවේ ප්‍රශ්නයට අදාළ පිළිතුරු B තීරුවෙන් තෝරා නිවැරදි ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න.

| | A | | B |
|---|---|---|---|
| 11. | මාලිමා යන්ත්‍රය සොයා ගැනීම | ☐ | A. මායා ශිෂ්ටාචාරය |
| 12. | පොළොවට අධිපති දෙවියන් "එන්කිකි" ලෙස හැඳින්වීය | ☐ | B. ඊජිප්තු ශිෂ්ටාචාරය |
| 13. | ක්‍රි.පූ 2600 - 1990 අතර කාලයේ දී මෙම ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය සිදුවිය | ☐ | C. චීන ශිෂ්ටාචාරය |
| 14. | ටුටන්කාමන් රජු | ☐ | D. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය |
| 15. | පළමු වරට රබර් බෝලය සෑදීම | ☐ | E. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය |

➢ ප්‍රශ්න අංක 16-20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහනින් තෝරා හිස්තැනෙහි ලියන්න.
(චීනය, යක්ෂ, නාග, මහානාම, ධර්මසේන, ශක, හිජ්රි, ඉන්දියාව)

16. ................................................ මුල්වරට වී වගාකර ඇති රට ලෙස හැඳින්වේ.

17. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව ලියවී ඇති වැදගත් ඓතිහාසික ග්‍රන්ථය වන මහාවංශය ................................................ හිමියන් විසින් රචනා කර ඇත.

18. වෙඩි බෙහෙත් මුල්වරට ලෝකයට හඳුන්වා දෙන ලැබුවේ ................................................ විසින්ය.

19. මුස්ලිම්වරු සිය ආගමික උත්සවය පැවැත්වීම සඳහා කාලය මැන ගැනීමට ................................................ වර්ෂ ක්‍රමය භාවිත කරයි.

20. විජය කුමරු ඇතුළු පිරිය මෙරටට ගොඩබැසින විටදී මෙහි ජීවත් වූයේ ................................................ නමින් හැඳින්වූ ගෝත්‍ර කණ්ඩායමට අයත් පිරිසකි. (ලකුණු 20 × 2 = 40 යි.)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න 04ට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

01. පහත සඳහන් A, B, C, D පිංතූර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A



(i) රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

..............................................................................................................

(ii) මෙම මූර්තිය අයත් ශිෂ්ටාචාරය නම් කරන්න.

..............................................................................................................

(iii) එම ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගරයක් නම් කරන්න.

..............................................................................................................

(iv) මෙම ශිෂ්ටාචාරයට අයත් ගංගා නම්නය නම් කරන්න.

.............................................................................................................. (ලකුණු 1 × 4 යි.)

B



(i) මෙම පිංතූරය හඳුනාගෙන නම් කරන්න.

..............................................................................................................

(ii) මෙය පිහිටි රටෙහි නම ලියන්න.

..............................................................................................................

(iii) මෙය පිහිටා ඇත්තේ කවර ප්‍රදේශයකද?

..............................................................................................................

(iv) මෙම නිර්මාණ ඉදිකර ඇත්තේ කවර කාර්යයක් සඳහා ද?

.............................................................................................................. (ලකුණු 1 × 4 යි.)

C



(i) මෙම පිංතූරයේ දැක්වෙන කාන්තාව නම් කරන්න.

..............................................................................................................

(ii) ඇය කවර රජකෙනෙකුගේ බිසව ද?

..............................................................................................................

(iii) එම රජු අයත්වන පෙළපත කුමක් ද?

..............................................................................................................

(iv) මොවුන් අයත් වන ශිෂ්ටාචාරය නම් කරන්න.

.............................................................................................................. (ලකුණු 1 × 4 යි.)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

D



(i) මෙම රූපයේ දැක්වෙන නිර්මාණය කුමක් ද?

..............................................................................................................

(ii) එය හමුවූ ප්‍රදේශය නම් කරන්න.

..............................................................................................................

(iii) මෙය භාවිතා කර ඇත්තේ කවුරුන් විසින් ද?

..............................................................................................................

(iv) මෙම නිර්මාණය සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය නම් කරන්න.

..............................................................................................................

(ලකුණු 1 × 4 යි)

(මුළු ලකුණු - 16 යි.)

02. (i) ඓතිහාසික වශයෙන් වැදගත් සිදුවීම් කිහිපයක් පහත දැක්වා ඇත. එම සිදුවීම් සිදුවූ වර්ෂ බුද්ධ වර්ෂයෙන් ලියා දක්වන්න.

A - බුද්ධ පරිනිර්වාණය

B - වසභ රජුගේ රාජ්‍ය පාලනය ආරම්භ වීම. (ලකුණු 02 යි.)

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(ii) ඉතිහාසය හැදෑරීමේ දි ඉවහල් වන මූලාශ්‍ර පහත වගුවේ දක්වා ඇත. එම වගුවේ හිස්තැන් සඳහා සුදුසු පිළිතුරු ලියා දක්වන්න.

| මූලාශ්‍රය | වර්ගය | රචනාවූ/ ඉදි වූ කාලය | කර්තෘ |
|---|---|---|---|
| දීපවංශය | සාහිත්‍ය මූලාශ්‍රයකි | (1) ........................... | සොයාගෙන නොමැත |
| මහාවංශය | සාහිත්‍ය මූලාශ්‍රයකි | (2) ........................... | (3) ................................ |
| පොලොන්නරුවේ ගල්විහාරය | පුරා විද්‍යාත්මක මූලාශ්‍රයකි | ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසයේදී | (4) ................................ |

(ලකුණු 1 × 4 = 4 යි.)

(iii) ඉතිහාසයේ විවිධ සිදුවීම් අයත් කාල වකවානු මැන ගැනීම සඳහා සුලබ ලෙස භාවිතා කරන ක්‍රම දෙකක් ඇත. එම ක්‍රම දෙක දක්වා ඒවා වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

03. (i) ඉතිහාසය හැදෑරීමේ දී යුග පිළිබඳව දැනුවත් බවක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. පහත සඳහන් යුගයන් හැඳින්වූ නම් ලියන්න.

A - මානව පරිනාමය සිදුවූ යුගය

B - පෘථිවියේ අධික ශීත දේශගුණය උණුසුම් බවට පත්වූ යුගය. (ලකුණු 02 යි.)

(ii) මානව පරිණාමය හා සම්බන්ධ පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

A - මිනිසෙකු වීමට නැඹුරුවක් ඇතිකළ පැරණිතම වානරයා නම් කරන්න.

B - ගල්පතුරු වලින් මුවහත් මෙවලම් සාදාගත් පළමු මානවයා නම් කරන්න.

C - පළමුවරට ගින්දර භාවිතා කළ මානවයා නම් කරන්න.

D - විශාල සතුන්ගේ ඇටකටු යොදා ගනිමින් නිවාස ඉදිකළ මානවයා නම් කරන්න.

(ලකුණු 04 යි.)

(iii) ගොවිතැන් කටයුතු ආරම්භවීමත් සමග මිනිසා විවිධ වූ ජයග්‍රහන හිමිකරගනු ලැබීය. ඔවුන් ලබාගත් ජයග්‍රහන **පහක්** ලියන්න. (ලකුණු 05 යි.)

04. (i) ශිෂ්ටාචාරයක් යනු කුමක් දැයි හඳුනාගැනීමට ඉවහල් වන මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(ලකුණු 02 යි.)

(ii) A මෙසපොතේමියාව යන වචනයෙහි අර්ථය ලියන්න. (ලකුණු 02 යි.)

B එම ශිෂ්ටාචාරයට අයත් ගංගා 02ක නම් කරන්න. (ලකුණු 02 යි.)

(iii) මෙසපොතේමියානු ජන සමාජය කොටස් 04කට බෙදී තිබුනි. රම කොටස් හතර නම් කර එම පිරිස් පිළිබඳව වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

05. (i) පහත සඳහන් ලෝක සිතියමෙහි පැරණි ශිෂ්ටාචාර ව්‍යාප්තවූ ප්‍රදේශ ඉංග්‍රීසි අක්ෂරවලින් නම් කර ඇත. එම ශිෂ්ටාචාර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ලියන්න.




(ලකුණු $\frac{1}{2} \times 4 = 2$ යි.)

(ii) ලෝකයේ පැරණි ශිෂ්ටාචාරය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(1) අප ඉගෙනගත් ශිෂ්ටාචාර අතරින් හඳුනානොගත් අක්ෂර ඇති ශිෂ්ටාචාරය නම් කරන්න.

(2) ලෝකයේ පැරණිතම සාහිත්‍ය කෘතිය නම් කරන්න.

(3) මෙසපොතේමියානු අක්ෂරමාලාව හැඳින්වෙන නම ලියන්න.

(4) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන ගංගාව කවර ප්‍රදේශයක් හරහා ගලාබසින්නේ ද?

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පිළිබඳව විස්තරයක් ලියන්න. (ලකුණු 05 යි.)

06. (i) ශ්‍රී ලංකාවේ ජීවත් වූ ආදිමානවයන් විසූ ගල් ලෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ඔවුන් ආහාර සඳහා ගත් ශාකමය ආහාර වර්ග දෙකක් සහ සත්ත්වමය ආහාර වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි.)

(iii) පහත සඳහන් කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) විජය කුමරු ඇතුළු පිරිස ගොඩබසින ලද්දේ ශ්‍රී ලංකාවේ කවර ස්ථානයකට ද?

(2) විජය කුමරු මෙරටට පැමිණීමේ කතා පුවත ඇතුළත් සාහිත්‍ය ග්‍රන්ථය කුමක් ද?

(3) විජය කුමරු මෙරටදී සරණපාවාගත් කාන්තාව නම් කරන්න.

(4) විජයගේ දරු දෙදෙනාගෙන් එක් අයෙක් නම් කරන්න.

(5) විජය කුමරු සමඟ පැමිණි පිරිස ගම්මාන ආරම්භ කරනු ලැබූවේ කවර ප්‍රදේශයක් ආශ්‍රිතව ද? (ලකුණු 05 යි.)